# දුතිය අපුත්තක සූත්‍රය

(සං.නි.i, කෝසල සංයුත්තය, 168 පිට)

සංයුත්ත නිකායෙහි කෝසල සංයුත්තයෙහි සඳහන් වන මෙම සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ විසින් පසේනදී කොසොල් රජතුමාට දේශනා කරන ලද්දකි. මීට පාදක වූයේ අවම පහසුකම් සහිතව ජීවත් වූ දරුවන් නොමැති ධනවත් සිටුවරයකුගේ ජීවිත කථාවයි. දන් දීමෙහි ආනිසංස පිළිබඳවත් එය මනාව නොදීමෙන් ලැබෙන අවාසි පිළිබඳවත් මරණයේ දී සියල්ල අතහැර යාමට සිදුවන බවත් තමා කළ කර්මය පමණක් දයාද කොට නැවත උපදින බවත් මෙම සූත්‍රයෙන් විස්තර කෙරේ.

දිනක් කොසොල් රජතුමා දහවල කාලයෙහි බුදුරජාණන් වහන්සේ වෙත එළඹ වැඳ එකත් පසෙක හිඳ ගත්තේ ය. එවිට භාග්‍යවතුන් වහන්සේ රජතුමාගෙන් විමසා සිටියේ '**රජතුමනි, මේ මධ්‍යාහ්නයෙහි කොහි සිට එන්නේ ද?**' කියායි. සැවැත් නුවර සිටුවරයකු මිය ගිය බවත් ඔහුට දරුවන් නොසිටි බැවින් ඔහුගේ ධනය රජ මැදුරට යවා තමා එන ගමන් යැයි රජතුමා පිළිතුරු දුන්නේ ය. ඔහුට කෝටියක් පමණ වටිනා රන් තිබූ බවත් රිදීවල පමණ සීමාවක් නැති බවත් සඳහන් කළ රජතුමා ඔහු ඉතා දුක්ඛිත ජීවිතයක් ගත කළ බව ද සඳහන් කළේ ය. කාඩි දෙවෙනි කොට නිවුඩු හාලේ බත් අනුභව කළ බවත් හණවලින් කළ වස්ත්‍ර දැරූ බවත් කොළ සෙවිලි කළ දිරාගිය රථයක් පාවිච්චි කළ බවත් වැඩි දුරටත් ප්‍රකාශ කළේ ය.

මෙහිදී භාග්‍යවතුන් වහන්සේ එම සිටුවරයාගේ අතීත ප්‍රවෘත්තියත් ඔහු මියගොස් දැනට උපත ලබා සිටින ස්ථානය පිළිබඳවත් කරුණු දක්වමින් ධර්මය දේශනා කළහ. ඒ අනුව එම සිටුවරයා අතීතයෙහි තගරසිඛී නම් පසේ බුදුරජාණන් වහන්සේට (සේවකයකු ලවා) නොසැලකිල්ලෙන් දනය දෙවා හුන් තැනින් නැඟී ගිය බවත් එම දනය දී පසුව ඒ ගැන පසුතැවුණ බවත් සඳහන් කළහ. එම දනයෙහි ආනිසංස වශයෙන් සත්වරක් සුගතියෙහි උපන් බවත් සත් වරක් ම සැවැත් නුවර සිටු තනතුර හෙබවූ බවත් දේශනා කළහ. **දනය දී පසුව එම ආහාර තම දාසි කම්කරුවන්ට දීමට තිබුණා නම් යෙහෙකැයි පසුතැවුණ බැවින් ධනය ලැබුව ද ආහාරපාන අනුභවයට හෝ වස්ත්‍ර පරිහරණයට හෝ රථවාහන පරිහරණයට හෝ සිත නොනැමුණ බව ද පැහැදිලි කළහ.** තව ද ධනය හේතුවෙන් තම සොයුරාගේ එක ම කුඩා පුතා ද දිවියෙන් තොර කිරීම (මැරීම) නිසා ඊට විපාක වශයෙන් වසර ලක්ෂ ගණනක් නිරයෙහි දුක් විඳ මනුලොව ඉපිද දරුවන් නොලද බව ද දේශනා කළහ. ඔහුගේ පැරණි කුසලය ගෙවී ගිය අතර අලුතින් පිනක් ද නොකළ හෙයින් මෙලොව හැරයාමත් සමඟ මහාරෞරව නව නිරයෙහි ඉපිද බොහෝ කලක් දුක් විඳින බව ද බුදුරජාණන් වහන්සේ වැඩිදුරටත් සඳහන් කළහ.

*ධඤ්ඤං ධනං රජතං ජාතරූපං පරිග්ගහං චාපි යදත්ථි කිඤ්චි,*

*දසා කම්මකරා පෙස්සා යෙ චස්ස අනුජීවිනො,*

*සබ්බං නාදය ගන්තබ්බං සබ්බං නික්ඛිප්පගාමිනං.*

ධාන්‍ය ද ධනය ද රිදී ද රන් ද තමා සතු යම් අනෙකක් ඇත්නම් ඒවා ද දාසයන් ද කම්කරුවන් ද මෙහෙකරුවන් ද තම අනුගාමිකයන් ද යන සියල්ල නොගෙන සියල්ල අතහැර යා යුතු ය.

*යඤ්ච කරොති කායෙන වාචාය උද චෙතසා,*

*තං හි තස්ස සකං හොති තඤ්ච ආදාය ගච්ඡති,*

*තඤ්චස්ස අනුගං හොති ඡායා'ව අනපායිනී.*

කයින් ද වචනයෙන් ද සිතින් ද කිසියම් කර්මයක් කෙරේ ද එය ම ඔහුට තමා සතු වේ. එය ම රැගෙන පරලොව යයි. තමා අත නොහැර යන සෙවනැල්ලක් මෙන් එය ම ඔහු අනුව යයි.

*තස්මා කරෙය්‍ය කල්‍යාණං නිචයං සම්පරායිකං,*

*පුඤ්ඤානි පරලොකස්මිං පතිට්ඨා හොන්ති පාණිනන්ති.*

එබැවින් පරලොවට වැඩදයී පින් දහම් රැස් කරන්න. පරලොව දී පින සත්ත්වයන්ට පිහිට පිණිස පවතී.

මෙම සූත්‍රයෙහි ඇතුළත් කරුණු අතර දානය මැනැවින් නොදීමෙන් සිදුවන ඉරණම පිළිබඳ කරුණ වැදගත් වූවකි. මැනැවින් දානය නොදීමෙන් ද දානය දීමෙන් පසු ඊට අනුගතව සතුටු නොවීමෙන් ද දානයෙන් ලැබෙන නිසි ආනිසංස නොලැබී යයි. මීට සම්බන්ධ වැදගත් විස්තරයක් වේලාම සූත්‍රයෙහි ද ඇතුළත් වේ.

වරෙක භාග්‍යවතුන් වහන්සේ සැවැත් නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩ වෙසෙන කල්හි අනාථපිණ්ඩික ගෘහපතිතුමා බුදුරදුන් වෙත පැමිණ උන්වහන්සේට වැඳ නමස්කාර කොට එකත් පසෙක සිටියේ ය. එහිදී බුදුරජාණන් වහන්සේ අනාථපිණ්ඩික ගෘහපතිතුමාගෙන් ප්‍රශ්නයක් අසමින් '**ගැහැවිය ඔබගේ කුලයේ අය දන් දෙන්නේද**'යි විමසී ය. එහි දී ගෘහපතිතුමා පිළිතුරු දෙමින් තම කුලයේ අය දන්දෙන බවත් එසේ දෙන්නේ රූක්ෂ වූ කාඩි දිය දෙවැනි කොට ඇති නිවුඩුහාලේ බත් බවත් සඳහන් කළේ ය. එවිට බුදුරදුන් සඳහන් කරන්නේ '**ගෘහපතිය, රූක්ෂ වේවා ප්‍රණීත වේවා යමෙක් සකස් නොකොට (*අසක්කච්චං*) දන් දේ ද ගරුසරු නැති ව (*අචිත්තිකත්වා*) දන් දේ ද සියතින් නොදේ (*අසහත්‍ථා*) ද නිතර දන් නොදේ (*අපවිද්ධං*) ද කම්ඵල නොඅදහා දන් දේ (*අනාගමනදිට්ඨිකො*) ද, යම් යම් තැනැක එම දානයේ විපාක ලැබෙන කල්හි උසස් වූ භක්තානුභවය (ආහාර අනුභවය) සඳහා ඔහුගේ සිත නොනැමෙයි. උදාර වූ වස්ත්‍ර පරිහරණය සඳහා සිත නොනැමෙයි. උසස් යානවාහන පරිහරණය පිණිස සිත නොනැමෙයි. උසස් පංචකාමගුණයන් පරිහරණය පිණිස සිත නොනැමෙයි. තවද ඔහුගේ දරුවන්, අඹුවන්, දාසයන්, මෙහෙකරුවන්, කම්කරුවන් ආදීහු ඔහුගේ වචනයට ඇහුම්කන් නොදෙති. දැනුම ප්‍රඥාව ලබනු පිණිස සිත නොනැමෙයි. ඊට හේතුව නොසකසා කම්ඵල නොඅදහා දන් දුන් බැවිනි.**'

ඒ අතර '**යමෙක් රූක්ෂ වූ හෝ ප්‍රණීත වූ හෝ තමන් විසින් පරිත්‍යාග කරන්නා වූ දෙය සකසා (*සක්කච්චං*), ගරුසරු ඇතිව (*චිත්තිකත්වා*), සියතින් (*සහත්‍ථා*), නිරතුරුව (අනපවිද්ධං), කම්ඵල අදහා (*ආගමනදිට්ඨිකො)* දේ නම් එහි විපාක වශයෙන් මහත් වූ සම්පත් ලබා ඒවා පරිහරණයට (*භත්තභෝගාය*) සිත නැමෙන අතර අඹුදරු - දාසි - කම්කරුවන් ආදීහු ඔහුගේ වචනයට අවනත වෙති. ධර්මාවබෝධය පිණිස ද ඔහුගේ සිත නැමෙයි. ඊට හේතුව මැනැවින් සකසා කම්ඵල අදහා දන් දුන් බැවිනි**'. මෙලෙස දානය හා එහි ආනිසංස කෙටියෙන් සඳහන් කළ භාග්‍යවතුන් වහන්සේ වේලාම නම් බමුණකු අතීතයේ දෙන ලද දානය පිළිබඳව කරුණු ඉදිරිපත් කරමින් සවිස්තරාත්මකව දානානිසංස පැහැදිලි කළහ. ඒ අනුව වේලාම නම් බමුණා අතීතයෙහි මහත් අසිරිමත් දානයක් දුන්නේ ය. ඔහු එහිදී රිදී පිරවූ අසූහාරදහසක් රන් බඳුන් දන් දුනි. තවද රන් පිරවූ අසූහාරදහසක් රිදී බඳුන් දන් දුනි. ඒ අතර අමුරන් පිරවූ අසූහාරදහසක් ලෝහ භාජන දන් දුනි. රනින් අලංකාර කර රන් රසුදැලින් ගැවසුණු ඇතුන් දහසක් දන්දුනි. තවද අගනා සම්වලින් වැසූ රන් දද සහිත අසූහාරදහසක් රිය දන්දුනි. ඊට අමතරව දෙනුන් අසූහාර දහසක් කන්‍යාවන් අසූහාරදහසක්, ආහාර පාන, වස්ත්‍රාභරණ ආදිය ගංගා ගලන්නාක් මෙන් දන් දුනි. එකල්හි වේලාම නමින් මෙලෙස මහ දන් දුන්නේ අන් අයකු නොව බෝසත් දම් පිරූ තමන් වහන්සේ ම බව මෙහි දී භාග්‍යවතුන් සඳහන් කළහ. මෙලෙස මහාදානයක් පිරිනැමුව ද එය මහත්ඵල මහානිසංසදයී විය හැකි එකදු දිට්ඨිසම්පන්නකු ද නොවූ බැවින් එම දක්ෂිණාව පිරිසිදු නොවූ බවත් එය මහත්ඵල මහානිසංසදයී නොවූ බවත් වැඩිදුරටත් විස්තර කළහ.

බුදුරදුන් පෙන්වා දුන් පරිදි පින්කම් ප්‍රධාන වශයෙන් කොටස් තුනකට බෙදේ. එනම්:

1. දාන
2. සීල
3. භාවනා

වශයෙනි.

දානයෙහි ආනිසංස වශයෙන් සසරෙහි භවභෝග සම්පත් ලැබීම හා ඒවා පරිහරණයට අවස්ථාව සැලසේ. සීලයෙහි ආනිසංස වශයෙන් සසරෙහි දෙව්ලොව, මිනිස්ලොව වශයෙන් සුගතියක් ලැබේ. භාවනාවෙහි ආනිසංස වශයෙන් නුවණ ලැබේ. සාර්ථක ජීවිතයක් සඳහා මේ පින්කම් තුන ම සම්පූර්ණ කර තිබීම එකසේ වැදගත් වේ. පිරිසිදු සිතින් යුතුව කියන කරන දෑ පින් වන අතර එය තම සෙවනැල්ල මෙන් මෙලොවදීත් පරලොවදීත් සැප විපාක ගෙන දේ (*මනසා චෙ පසන්නේන භාසති වා කරොති වා තතො නං සුඛමන්වෙති ඡායාව අනපායිනී*). එනිසා පිරිසිදු සිතින් යුතුව දානාදි ත්‍රිවිධ පුණ්‍යක්‍රියා නිතර නිතර සිදු කරන ලෙසත් (*කයිරා තෙ තං පුනප්පුනං*) පිනට කැමැත්තක් ඇති කර ගන්නා (*තම්හි ඡන්දං කයිරාථ*) ලෙසත් පිනට බිය නොවන (*මා පුඤ්ඤස්ස භායී*) ලෙසත් කුඩා වුව ද පිනට අවමන් නොකරන (*මාවමඤ්ඤෙථ පුඤ්ඤස්ස*) ලෙසත් සැප යනු පිනට කියන නමක් ලෙසත් (*සුඛො පුඤ්ඤස්ස වුච්චයො*) භාග්‍යවතුන් වහන්සේ ඉමහත් කරුණාවෙන් දේශනා කර තිබේ. පින් කරන තැනැත්තා මෙලොවත් සතුටු ව (*ඉධ නන්දති*) පරලොවත් සතුටු ව (*පෙච්ච නන්දති*) දෙලොව ම සතුටට පත් වේ (*කතපුඤ්ඤො උභයත්ථ නන්දති*). ජීවිතය අවසානයෙහි සැප පිණිස පවතින්නේ ද රැස්කර ගත් පින පමණි (*පුඤ්ඤං සුඛං ජීවිතසංඛයම්හි*).

දානය වූ කලි ආමිසදාන, අභයදාන, ධර්මදාන වශයෙන් මෙය විවිධාකාරයෙන් සම්පූර්ණ කළ හැකිය. ආමිසදාන යනු ආහාරපාන, ඇඳුම් පැලඳුම්, බෙහෙත් ද්‍රව්‍ය, යානවාහන, නිවාස ආදි වශයෙන් සිදුකරන පරිත්‍යාගයන් ය. අභය දාන යනු නිර්භයතාව නොහොත් ජීවත්වීමේ අවස්ථාව ලබාදීම් වශයෙන් සිදුකරන දානයන් ය. මරණයට නියම ව ඇති සත්ත්වයන් ඉන් මුදවාලීම මීය අයත් වේ. ධර්මදාන යනු ධර්මදේශනා කිරීම්, දහම් පොත්පත් බෙදදීම් ආදි වශයෙන් තථාගත දේශිත සද්ධර්මය ජනතාව අතර පතුරුවාලීමට සිදුකරන පරිත්‍යාගයන් ය. මෙම දාන තුන අතර ධර්මදානය වඩාත් උතුම් ය (*සබ්බදානං ධම්මදානං ජිනාති*).

තවද දානය වූ කලි පෞද්ගලික දාන සහ සාංඝික දාන වශයෙන් දෙවැදෑරුම් කොට දක්වා තිබේ. පෞද්ගලික දාන අතර සම්මාසම්බුදු රජාණන් වහන්සේ නමකට පුදන දානය උතුම් ම දානය වන අතර සංඝයා උදෙසා දෙන දානය ඊට වඩාත් ආනිසංසදායී වේ. සාංඝිකව යමක් පූජා කිරීමේ දී බුදුරජාණන් වහන්සේ ද ඊට අයත් වේ.

**තිරිසන්ගත සත්ත්වයාගේ පටන් විවිධ තලවල විවිධ ආධ්‍යාත්මික ස්තරවල සිටින අයට දානය පූජා කළ හැකිය. තිරිසන්ගත සතකුට දෙන දානය සියයක් ආනිසංසදායී වූවක් වශයෙන් දක්වා තිබේ. එලෙස තිරිසන්ගත සතෙකුට දෙන දානයට වඩා දුශ්ශීල වුව ද මිනිසකුට දෙන දානය වඩාත් ආනිසංසදායී වේ. මහත්වූ ධන, ධාන්‍ය, වස්තු, වස්ත්‍රාදිය දහස්ගණන් මිසදිටුවන්ට පුදනවාට වඩා දිට්ඨිසම්පන්න එක තැනැත්තකුට දෙන දානය වඩාත් ආනිසංසදායී බව භාග්‍යවතුන් වහන්සේ දේශනා කළහ. තවද දිට්ඨිසම්පන්නයන් සියයකට දෙන දානයට වඩා සකදාගාමී එක් අයකුට දෙන දානය මහත්ඵල මහානිසංස බවත්, සකදාගාමී වූවන් සියයකට දෙන දානයට වඩා එක් අනාගාමී තැනැත්තකුට දෙන දානය මහත්ඵල බවත්, අනාගාමී වූවන් සියයකට දෙන දානයට වඩා එක රහත් උතුමකුට දෙන දානය මහත්ඵල බවත්, රහත් උතුමන් සියයකට දෙන දානයට වඩා එක පසේබුදුවරයකුට දෙන දානය උතුම් බවත්, පසුබුදුවරුන් සියයකට දෙන දානයට වඩා එක සම්මා සම්බුදුවරයකුට දෙන දානය මහත්ඵල බවත් බුද්ධප්‍රමුඛ සංඝයාට දෙන දානය වඩාත් ම ආනිසංසදායී බවත් දේශනා කළහ. සඟසතු දානයට ද වඩා සිව්දෙසින් වඩනා මහසඟනට වෙහෙරක් කරවා පූජා කිරීම ආනිසංසදායී වන අතර බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් සරණ යාම ඊට වඩා ආනිසංසදායී වන බවත් පංචශීලය රැකීම ඉහත කී සැමට වඩා ප්‍රතිඵලදායී ආනිසංසදායී බව දේශනා කළහ. සීලයට ද වඩා සුළු මොහොතක් නමුදු මෙත් සිත වැඩීම ආනිසංසදායී බවත් අසුරු සැණක් ගහන මොහොතක් නමුදු අනිත්‍ය සංඥාව වැඩීම වඩාත් ම මහත්ඵල මහානිසංසදායී බවත් අවසාන වශයෙන් අවධාරණය කළහ (*යො ච අච්ඡරාසඞ්ඝාතමත්තම්පි අනිච්චසඤ්ඤං භාවෙය්‍ය ඉදං තතො මහප්ඵලතරන්ති*). වේලාම සූත්‍රය**

මේ අනුව මානසික සුවතාව ඉහළට ම දියුණු කර ගැනීමේ සාර්ථක ම ක්‍රමය වශයෙන් බුදුදහමෙහි දක්වෙන්නේ භාවනාවයි. භාවනාවෙන් සිත පිරිසිදු කර ගැනීම වඩාත් වේගවත්ව කර ගත හැකි අතර තම ආධ්‍යාත්මික ශක්තිය වඩාත් ප්‍රබල කර ගැනීමට ද භාවනාව උපකාරී වේ. එබැවින් දාන, සීල, භාවනා යන ත්‍රිවිධ **පුණ්‍ය ක්‍රියා අතර භාවනාව පිළිබඳව බුදුදහමින් වැඩි අවධානයක් යොමු කර තිබෙනු දක්නට ලැබේ. මෛත්‍රී ආදි සමථ භාවනාවකින් ලැබෙන ආනිසංස දාන, සීල යන කුසලයන්ට වඩා ප්‍රබල වන අතර ඉතා ස්වල්ප වේලාවක් නමුදු අනිත්‍ය සංඥාව වැඩීම කුසල් දියුණු කර ගත හැකි මෙන් දුකින් නිදහස් විය හැකි වඩාත් ම සාර්ථක මෙන් ම වේගවත් ම ක්‍රමය වශයෙන් බුදුදහමින් අවධාරණය කෙරේ.**

බෝසත්දම් පුරන උතුමෝ ඒ සඳහා වැඩිය යුතු පාරමිතා අතර මුලින් ම පුහුණු කරන්නේ දානයයි. සියලු ආධ්‍යාත්මික ගුණදහම්වල ආරම්භක පියවර දානයයි. එනිසා බුදුදහමෙහි නොයෙක් තැන දානය මූලික අංගයක් වශයෙන් දක්වා තිබේ. ත්‍රිවිධ පුණ්‍යක්‍රියා, සතර සංග්‍රහ වස්තු, සත්තවතපද, දසපාරමිතා, දසරාජ ධර්ම ආදි නොයෙක් තැන්හි මෙය දක්නට ලැබේ. දන්දීමෙන් ආයු, වර්ණ, සැප, බල, ප්‍රතිභාන ආදි ආනිසංස ලැබෙන අතර එමගින් කල්‍යාණ මිත්‍ර ඇසුරට ද මග පාදයි. සමාජගත ජීවිතයේ දී දානය මිතුරන් දිනා ගැනීමේ ක්‍රමයක් ලෙස ආලවක සූත්‍රයෙහි සඳහන් වේ (*දදං මිත්තානි ගන්ථති*). දන් දෙන තැනැත්තා උදාර වූ සතුටක් භුක්ති විඳියි (පීතිමුදග්ගං වින්දති දතා). සුමනා සූත්‍රයෙහි දැක්වෙන පරිදි දන් දුන් තැනැත්තාගේ හා නොදුන් තැනැත්තාගේ වෙනස දිව්‍ය මනුෂ්‍ය හැම තැන්හිමත් ගිහි පැවිදි දෙපිරිස ම අතරත් දැක ගත හැකි ය. එබැවින් දන්දීම බුදුදහමින් බෙහෙවින් අගය කෙරේ.

භෞතික වශයෙන් අප ගොඩනගා ගත් සියලු දෑ නොයෙක් විධියේ ව්‍යසනයන්ගෙන් විනාශ විය හැකිය. මරණයේ දී ඒ සියල්ල එක මොහොතකින් අපට අහිමි වේ. ඉන්පසු අපට ඉතිරි වන්නේ සිත මුල් වී කයින් වචනයෙන් සිතින් කළ කී දෙයෙහි විපාක පමණි. එනිසා බුදුරජාණන් වහන්සේ නිතර අපට අනුශාසනා කළේ පරලොව සැප පිණිස හේතුවන පින්දහම් වැඩිපුර සිදු කර ගන්නා ලෙසයි. වැඩිපුර පින්රැස් කර ගැනීම වැඩිපුර සැප රැස් කර ගැනීමකි. විශේෂයෙන් දානමය වශයෙන් ජීවිතයෙන් යමක් වෙන් කර ගැනීම ගිනිගත් ගෙයකින් යමක් ඉවත් කර ගැනීමක් හා සමානව දක්වා තිබේ (ආදිත්ත සූත්‍රය, සං.නි.i).

පුණ්‍යක්‍රියාවලින් උපදවා ගන්නා ආධ්‍යාත්මික ශක්තිය හා ආනිසංස අප සම්පූර්ණයෙන් ම උපයෝගී කර ගත යුත්තේ සමථ විදර්ශනා භාවනා වැඩීම සඳහා යි. මෙබඳු බුද්ධොත්පාද සමයක බුද්ධිමත් මනුෂ්‍යයකුට තම ජීවිතයෙන් ලද හැකි ඉහළ ම ආනිසංසය වන්නේ උපරිම ලෙස සමථ - විදර්ශනාවන්හි යෙදෙමින් වහ වහා දුකින් නිදහස් වීමයි. එනම් සන්තානගත රාග, ද්වේශ, මෝහ දුරුකරලීමයි. සමථ යනු මෛත්‍රී භාවනාව ආදි කිසියම් කුසල අරමුණක බොහෝ වේලාවක් එකඟ කර ගැනීමයි. එලෙස සිත එකඟ වූ කල්හි ස්කන්ධ ධාතු ආයතන නාමරූප ආදි පරමාර්ථ ධර්මයන්හි පවත්නා අනිත්‍ය - දුක්ඛ - අනාත්මතාව නුවණින් මෙනෙහි කිරීම විපස්සනාවයි.

# ඔබ සැමට තෙරුවන් සරණයි !

# බු.ව. 2562 (ව්‍ය.ව. 2019) දුරුතු පොහෝදා සීල සමාදානය

## ධර්මවිජය බෞද්ධ විහාරස්ථානය - ලොස් ඇන්ජලිස් - කැලිෆෝනියාව

(ජනවාරි 06)